# ජේතවනාරාම සංකීර්ණය ආශ්‍රිතව හමු වී ඇති ඕලන්ද කාසි පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**කේ.එස්.එන්.කේ. කරුණාදාස[*], කේ.එම්.එස්.ආර්. කුලතුංග[**]**

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය
[*]Sameeranuwankumara92@gmail.com
[**]Shashi359kulathunga@gmail.com

**ප්‍රමුඛ පද :** ජේතවන ආරාම සංකීර්ණය, පශ්චාත් ජේතවන සමය, ඕලන්ද පාලකයින්, ඕලන්ද කාසි, විනිමය මාධ්‍යය

## හැඳින්වීම

ඕලන්ද පාලකයින් ශ්‍රී ලංකාවේ වෙළඳ ඒකාධිකාරය තහවුරු කර ගැනීමේ පරමාර්ථයෙන් ඔවුන්ගේ ආර්ථික සම්පත් පවතින ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත. ඒ බව තහවුරු කරන නාණක මූලාශ්‍ර මෙහි දී වැදගත්වන අතර ජේතවනාරාම සංකීර්ණයෙන් ඕලන්ද කාසි ලැබීමේ පදනම කුමක් ද යන්න ගැටළු සහගතය. මෙය ආගමික ස්වරූපයකින් ගොඩනැගී තිබුණ ද සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික ආදී ගනුදෙනු පශ්චාත් ඕලන්ද සමය දක්වා සිදු වී ඇති බවට පිළිබිඹු කරන පුරාවස්තු රාශියක් හමු වී ඇත. ඒහි දී ජේතවනාරාමය ආශ්‍රිත පුරාවිද්‍යා කැණීම් හා ගවේෂණ මඟින් ඕලන්ද කාසි ලැබීමේ සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලන ප්‍රවණතාවය කුමක් ද යන්න විමසීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ ගැටළුව විය.

පර්යේෂණයේ මූලික අරමුණ ලෙස මෙතෙක් ජේතවන ආරාම සංකීර්ණයෙන් හමු වී ඇති ඕලන්ද කාසි පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කර නොමැති අතර ඒ පිළිබඳව විධිමත් අධ්‍යයනයක් හා වාර්තාකරණයක් සිදු කිරීම වඩාත් වැදගත් විය. මීට අමතර ව මෙම අධ්‍යයනයේ මූලික අරමුණු ලෙස ජේතවනාරාම සංකීර්ණයෙන් හමු වී ඇති ඕලන්ද කාසි සඳහා නිශ්චිත අනන්‍යතාවයක් ලබාදීම, ඕලන්ද සමයේ පැවැති විනිමය මාධ්‍යය පිළිබඳව විමර්ශනයත්, පශ්චාත් ජේතවනය හා බැඳි ඕලන්ද සමයට අයත් ඓතිහාසික සංසිද්ධි මෙන්ම ඕලන්ද පාලන සමයේ පැවැති සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික රටාව පිළිබඳ සොයාබැලීම මෙමඅධ්‍යයනයේ මූලික අරමුණු විය.

## ක්‍රමවේදය

ජේතවන ආරාම සංකීර්ණය තුළින් ඕලන්ද කාසි හමුවීමේ සමාජ, ආර්ථික ප්‍රවණතාවය කුමක් ද යන්න විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටළුව විය. එහි දී ගවේෂණ ක්‍රමවේදය ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදු කරන ලදි. එනම් පුස්තකාල අධ්‍යයනය හා ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය වේ. පුස්තකාල අධ්‍යයනය ප්‍රවේශයේ දී ද්විතික හා ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනය මෙන් ම සිතියම්, වාර්තා, සැලසුම් පරීක්ෂාව ද සිදු කරන ලදි. එහි දී පුස්තකාල අධ්‍යයනය ක්‍රමවේදය ඔස්සේ මුදල් ව්‍යවහාරය පිළිබඳ ඓතිහාසික සන්දර්භය විමසුමට ලක් කරමින් එහි ශ්‍රී ලාංකීය පසුබිම කුමක් ද යන්න සාකච්ඡාවට බඳුන් කරන ලදි. එහි දී ඕලන්ද ජාතිකයින්ගේ බල ව්‍යාප්තිය හා

ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තිවල ස්වභාවය කෙසේ හැඩගැසුනේ ද යන්න අධ්‍යනයට ලක් විය. ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදු කල අතර එහි දී නියැඳි පරීක්ෂාව හා ආංශුක ගවේෂණය මූලික විය. නියැඳි පරීක්ෂාවේ දී ජේතවන ආරාම සංකීර්ණයේ 2000 සිට 2008 දක්වා පුරාවිද්‍යා කැණීම් තුළින් ලැබී ඇති ඕලන්ද කාසි එකතුව ප්‍රධාන නියැඳිය ලෙස තෝරා ගන්නා ලදි. එම ඕලන්ද කාසි නියැඳිය අධ්‍යයනය මඟින් ඒ පිළිබඳව තොරතුරු ලබා ගැනීම සිදු විය. ආංශුක ගවේෂණයේ දී සැලසුම් ඇඳීම, ක්ෂේත්‍ර සටහන් පොත් තැබීම, ඡායාරූප ගැනීම, දළ සැලසුම් ඇඳීම සිදු කරන ලදි. දත්ත එක්රැස් කිරීම හා වාර්තාකරණ ක්‍රමවේදය යටතේ ක්ෂේත්‍ර සටහන් තැබීම, ප්‍රස්තාර සටහන් ඇඳීම, සැලසුම් ඇඳීම, ඡායාරූප ගැනීම, නියැඳි රැස් කිරීම හා ඒවා වගු සටහන් මඟින් වාර්තාකරණය සිදු විය. සැලසුම් නිර්මාණය පරිමාණුකූල හා දළ සැලසුම් ලෙස සිදු කරන ලදි. වර්ගීකරණය යටතේ කාසිවල සුවිශේෂි ලක්ෂණයන්, ස්වරූපයත්, හමු වූ ස්ථාන හා ප්‍රමාණ අනුවත් සිදු විය. එම දත්තයන් වගු මඟින්, ඡායාරූප මඟින් හා දළ සැලසුම් ඇඳීම තුළින් සංසන්ධනාත්මක ලෙස විශ්ලේෂණය සිදු කෙරිණි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

වර්ෂ 2000-2008 දක්වා පුරාවිද්‍යා පර්යේෂණවලින් සොයාගත් ඕලන්ද කාසි 323ක් මෙහි දී අධ්‍යයන. නියැඳිය විය. ඒ අනුව මූලික ලෙස ඕලන්ද කාසි වර්ග 06ක් හදුනාගනු ලැබිණි. එ මෙන්ම දූර්වල කාසි 20ක් ද මඳ වශයෙන් දූර්වල වු කාසි 69ක් ද ඉතා පැහැදිලි දත්ත සහිත කාසි 40ක් ද හඳුනාගන්නා ලදි. විශේෂයෙන් මුද්‍රණ දෝෂ සහිත කාසි 25ක් ද හඳුනා ගැනීම වැදගත් විය. මෙම පුරාවස්තු සඳහා නිශ්චිත අනන්‍යතාවක් ලබාදීම සඳහා ලේඛනයක් ද පිළියෙල කරන ලදි. එනම් පුරාවස්තුව හමු වූ වර්ෂය, හමු වී ඇති ග්‍රිඩ් අංකය, ස්ථානය, හමු වී ඇති කාසි ප්‍රමාණය, ඒවායේ ස්වරූපය අනුව එය සිදු කරන ලදි. හමු වු ස්ථාන අනුව සැළසුමක් ද නිර්මාණය ඉතා වැදගත් විය. පුරාවස්තු හමුවීමේ ප්‍රවණතාව හා හමු වී ඇති ස්ථානය අනුව උපකල්පන හා අනුමාණ ගොඩනැගීමට ද හැකි විය. එහි දී විශේෂයෙන් ජේතවනාරාම සංකීර්ණයෙන් හමු වී ඇති ඕලන්ද කාසිවල ප්‍රධාන වර්ගීකරණයට අදාළ කිසිදු වාර්තාකරණයක් මෙතෙක් සිදු වී නොමැති බව හඳුනාගැනීම ප්‍රධාන ප්‍රතිඵලයක් විය. එ මෙන්ම 1730 සිට 1792 දක්වා ඕලන්ද පාලන සමයට අයත් මුද්‍රිත කාසි ජේතවනාරාමයෙන් ලැබීම තුළ මේ ආශ්‍රිත ජන සමාජයේ ඕලන්ද පාලනය යටතේ විධිමත් ගනුදෙනු රටාවක්, ආර්ථික රටාවක්, සමාජ හා දේශපාලන රටාවක් ක්‍රියාත්මක වී ඇතිබව උපකල්පනය කළ හැකි වේ.

මේ ආශ්‍රිතව ඕලන්ද කාසි ලැබීමේ ප්‍රවණතාව මත බහුල වශයෙන් මෙම සාධක ස්තූපය ආශ්‍රිත ව ලැබී ඇතිබව පෙනීයයි. ඒ අනුව ඕලන්ද පාලන සමයේ දී ජේතවන ජන සමාජයේ ජීවත් වු මිනිසූන් ස්තූපය සමඟ සමීප සබඳතාවක් හා විවිධ ගනුදෙනු මේ ආශ්‍රිත ව සිදු කර ඇතිබව උපකල්පනය කළ හැකි ය. නමුත් එම ගනුදෙනු රටාවේ ස්වරූපය පිළිබඳ ගැටළු සහගත බවක් පැවතිය ද ඒ පිළිබඳ යම් යම් උපකල්පන ගොඩනැගිය හැකි වේ. මේ අනුව පශ්චාත් ජේතවන ජන සමාජයේ ඓතිහාසිකත්වය, සමාජ වැදගත්කම්, පංති ස්තරායනයන්, ගනුදෙනු ක්‍රම වල ස්වභාවය මෙන් ම දේශපාලන බල අධිකාරයේ ස්වභාවය පෙන්වයි. එම නිසා මෙහි සුවිශේෂී සමාජ ආර්ථික ප්‍රවනතාවක් පවතින්නට ඇතිබව උපකල්පනය කළ හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

කල්දේරා, ලීලානන්ද (1959) ***ලංකාවේ මිල මුදල් - ක්‍රි.ව 6 වැනි ශතවර්ෂයේ සිට 20 වැනි ශතවර්ෂය දක්වා.*** කොළඹ: ශ්‍රී ලංකා කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

Codrington, H.W. (1924) ***Coins and currency***. Colombo: A.C Richards Acting Government Printer.

Scholten, C. (1953) ***The coins of the Dutch overseas territories 1601-1948 (Indian Coinage).*** Amsterdam: J Schulman published.